සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

**සැලකිය යුතුයි:**

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **40කි.**

(ii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) පැමිණෙන්නට සිටින මෙසියස් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳව ප්‍රකාශ වන දිවැස් වැකියකි.

(1) බලන්න කන්‍යාවක් පිළිසිඳගෙන පුතකු බිහි කරන්නීය.

(2) එතුමාණෝ යුක්තියෙන් ද ධර්මිෂ්ඨකමින් ද රජකම් කරන සේක.

(3) අන්ධකාරයේ ඇවිද්ද සෙනග මහත් ආලෝකයක් දුටුවෝය.

(4) අපට ළදරුවෙක් උපන්නේය අපට පුත්‍රයෙක් දෙන ලද්දේ ය.

(02) ස්නාවක ජොහාන්තුමා සමිඳුන්ට පෙරටුව ගොස් ජනතාවට දේව රාජ්‍ය පිළිගැනීමට මග පිළියෙල කරන බව ප්‍රකාශ කළ දිවැසිවරයා වන්නේ,

(1) මලාකි (2) එසකියෙල් (3) මීකා (4) යෙසායා

(03) ''බොහෝ දෙන ඔහුගේ උපත නිමිත්තෙන් ප්‍රීති වන්නාහ'' මෙහි සඳහන් ඔහු යනු,

(1) ජේසුස් වහන්සේ ය. (2) පාවුල් ය. (3) පේදුරු ය. (4) ස්නාවක ජොහාන් ය.

(04) දාවිත් නුවර උපන් ක්‍රිස්තුස් නම් ගැලවුම්කරුගේ උපත පිළිබඳ එඬේරුන් ලද සලකුණ වන්නේ,

(1) වල්ගා තාරුකාව (3) ගව ඔරුවක බාවා සිටින බිළිඳා

(3) ගවලෙන තුල ඇති ඔරුවක් (4) දීප්තිමත් තාරකාවක්

(05) මිසරයේ වහල්කමේ සිටි ඉශ්රායෙල් ජනතාවගේ කුළුදුල් පිරිමි දරුවන් ලද රැකවරණය සිහිකරනු සඳහා පැවැත් වූ ජුදා චාරිත්‍රයකි.

(1) චර්මඡේදනය (3) පාස්කු මංගල්‍ය සිහිකිරීම

(2) කැපකිරීම (4) අස්වැන්න මංගල්‍යය

(06) ජෙරුසලම දේව මාලිගයේ බිළිඳු ජේසුස් පිළිබඳ සිමියොන් නමැති බැතිමතා කල වැදගත් ප්‍රකාශනයකි.

(1) මෙසියස් වහන්සේ දෙන ගැලවීම සියලු ජාතීන්ට විවෘත බව

(2) මෙසියස් වහන්සේ ගැන දෙවිඳුන්ට තුති පිදිය යුතු බව

(3) ජෙරුසලමේ විමුක්තිය තවදුරටත් බලා සිටිය යුතු බව

(4) මෙසියස් වහන්සේ තුළින් ඉශ්රායෙල් ජනතාව පමණක් ආලෝකය ලබන බව

(07) ''එබැවින් ආබ්‍රහම් අපගේ පියාණෝ යයි සිතින් කියා නොගෙන මනස්ථාපනය වූ බව දක්වෙන ලෙස හැසිරෙන්න.'' ස්නාවන ජොහාන්තුමා මෙසේ පැවසුවේ කා හට ද?

(1) සාමාන්‍ය ජනතාවට (3) ජුදා ආගමික ජනතාවට

(2) අයකැමියන්ට (4) ආරක්ෂක අංශයට

(08) ''කමත හොඳ හැටි පිරිසිදු කරන පිණිසත්, ධාන්‍ය පොලා සිය අටුවේ රැස්කරන පිණිසත් උන්වහන්සේගේ අතේ කුල්ල ඇත'' මින් අදහස් කරනුයේ,

(1) ජේසුස් වහන්සේ මිනිස් ජීවිතය පිළිබඳ අවසාන තීරණය ගන්නා බවය.

(2) ජේසුස් වහන්සේ කමත පිරිසිදු කරන බවය.

(3) ජේසුස් වහන්සේ ධාන්‍ය පොලා අටුවේ රැස්කරන බව ය.

(4) ජේසුස් වහන්සේ මිනිසාට අවසන් අවවාදය ප්‍රකාශ කල බව ය.

(09) ජෙරුසලමෙන් ඈත්ව ජීවත් වූ ජුදෙව්වන් තම ආගමික කටයුතු සඳහා සිනගෝගයට රැස්වූහ. එහි ප්‍රධාන කාර්ය වූයේ,

(1) ජනතාව වෙනුවෙන් යැදීම (3) වත් පිළිවෙත් ඉටු කිරීම

(2) එකිනෙකා පිළිබඳ දැනුවත් වීම (4) ආගමික දැනුම ඉගැන්වීම

(10) නාසරෙත් ධර්ම ශාලාවේ දී ජේසුස් වහන්සේ යොදාගත් ප්‍රස්ථා පිරුළකි.

(1) ගමේ පූජකයා ගමට අගේ නැත. (3) ගමේ ගුරුවරයා ගමට අගේ නැත.

(2) ගමේ දිවැසිවරයා ගමට අගේ නැත. (4) ගමේ එඬේරා ගමට අගේ නැත.

(11) ''විශේෂ මෙහෙයක් සඳහා පුහුණුකර යවනු ලැබූ'' යන අර්ථය ගෙන දෙන්නේ,

(1) ප්‍රේරිතයන් (2) ශ්‍රාවකයන් (3) ගෝලයන් (4) වෘත්තිකයන්

(12) ''මාගේ මෑණියොත්, සහෝදරයොත් නම් දෙවියන් වහන්සේගේ වචනය අසා ඒවා පිළිපදින්නෝ වෙති.'' මින් අදහස් කරන්නේ,

(1) වචනය ඇසීම හා එය ඉගැන්වීම (3) වචනය ඇසීම හා එය පිළිපැදීම

(2) වචනය ඇසීමට මූලික වීම (4) පිළිපැදිය යුතු කරුණු සොයා බැලීම

(13) ''අන්‍ය ජාතීන් හා මිශ්‍ර වීම නිසා අපවිත්‍ර වූ'' ජන කොටසක් ලෙස පිළිගැනුනේ,

(1) එසීනවරු (3) එඬේරුන්

(2) සමාරිතයන් (4) හෙරොදිවරුන්

(14) ''සැඩොක්'' නමැත්තකුගෙන් පැවතෙන්නන් ලෙස පිළිගන්නේ,

(1) හෙරොදිවරු (2) එසීනවරු (3) පරිසිවරු (4) සද්දුසිවරු

(15) ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ පදනම සාමය බව සංකේතාත්මකව ඉදිරිපත් කල අවස්ථාවක් වන්නේ,

(1) රාජ තේජසින් ජෙරුසලමට පිවිසීම

(2) කානාහි වතුර වයින් කිරීම

(3) ගෙරසේනයන්ගේ රටේ යක්ෂාත්ම දුරු කිරීම

(4) මුහුද මත පයින් යාම

(16) ජේසුස් වහන්සේගේ දහඩිය බිංදු ලේ බිංදු බවට පත් වූ බව පැවසෙන අවස්ථාව වන්නේ,

(1) රූප විපර්යාසය හෙවත් අන්වෙසක් වීමේ දී

(2) පාළුකරයේ දින 40ක් යාච්ඤාවේ දී

(3) ඔලීව කන්දෙහි යාච්ඤාවේ දී

(4) කුරුසිපත් කරන මොහොතේ දී කුරුසිය උසුලා යාමේ දී

(17) ''ඔබ දෙවියන් වහන්සේගේ ක්‍රිස්තුවරයාණෝ ය'' මෙය

(1) පේදුරුගේ ඇදහිල්ලයි.

(2) පේදුරුගේ අපලාපයයි.

(3) පේදුරුගේ මහ ප්‍රකාශයයි.

(4) පේදුරුගේ විලාපයයි.

(18) ජේසුස් වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳ ශුභාරංචිය මුලින් ම අත්දුටුවේ,

(1) කාන්තාවෝ

(2) ශ්‍රාවකයෝ

(3) එඬේරුන්

(4) පූජකයෝ

(19) ජේසුස් වහන්සේ ජීවමානව වැඩ වසන බව රොටි ගෙන ආශිර්වාදය පවසා දුන් අවස්ථාවේ හඳුනාගන්තේ කවුරුන් ද?

(1) ජාකොබ් (2) සීමොන් (3) බර්තොලමෙවුස් (4) ක්ලෙයෝපස්

(20) ''ගින්න, හා වලාපටලය'' සංකේතවත් කරන්නේ,

(1) දේව අනුග්‍රහය

(2) දේව අනුහස

(3) දේව භය

(4) දේව අභිමුඛත්වය

(21) ජනතාවට මනස්ථාපනයේ බෞතීස්මය ලබාදීමට කටයුතු කළේ,

(1) ජේසුස් වහන්සේ

(2) පේදුරු

(3) ස්නාවන ජොහාන්

(4) ශුද්ධාත්මයාණන් වහන්සේ

(22) ජේසුස් වහන්සේට පැමිණි පරීක්ෂා තුලින් ජය ගැනීමට උන්වහන්සේ ක්‍රියා කළේ,

(1) දේව බලය උපයෝගී කරගත් සේක.

(2) ශුද්ධ ලියවිල්ල උපයෝගී කරගත් සේක.

(3) තම දැනුම උපයෝගී කරගත් සේක.

(4) තම ශක්තිය උපයෝගී කරගත් සේක.

(23) අපද බොහෝ ජීවිත පරීක්ෂාවන්වලට මුහුණ දෙනු ලබන අතර එවන් අවස්ථාවල දී

(1) සැප මෙන් ම දුක ද විඳ දරා ගත යුතුවේ.

(2) නිවසේ ආරක්ෂාවන් පිළිබඳ සැලකිය යුතු වේ.

(3) තම ප්‍රශ්න දේවගැතිවරුන්ට පැවසිය යුතුවේ.

(4) ශුද්ධාත්මයාණන් වහන්සේගේ මඟපෙන්වීම සෙවිය යුතුවේ.

(24) ජේසුස් වහන්සේගේ රූප විපර්යාස පිළිබඳ ජීවමාන අත්දැකීම ලද ශ්‍රාවකයින් වන්නේ,

(1) පේදුරු, ජාකොබ්, ජොහාන්

(3) ජොහාන්, ජුදස්, තෝමස්

(2) පේදුරු, ජොහාන්, ඇන්ඩෘ (47ජාකොබ්, ජොහාන්, ඇන්ඩෘ

(25) ජේසුස් වහන්සේගේ රූප විපර්යාස අවස්ථාවේ උන්වහන්සේ දෙපස දර්ශනය වූයේ,

(1) මෝසෙස් හා එලිෂා (3) ජෙරමියා හා මීකා

(2) මෝසෙස් හා එලීයා (4) මීකා හා මලාකි

(26) දේව රාජ්‍ය තුළ ආධිපත්‍ය හා බලය ඇත්තේ,

(1) ජේසුස් වහන්සේට (3) දෙවියන් වහන්සේට

(2) මිනිසාට (4) ශුද්ධාත්මයාණන් වහන්සේට

(27) ජොහාන් සුබසුනේ ''සේමෙයොන්'' යන ග්‍රීක් වදන භාවිත වන්නේ,

(1) දේව සැලසුමට (3) දේව බලයට

(2) දේව බල සලකුණු වලට (4) දේව මාලිගයට

(28) ''දාවිත්ගේ පුත්‍රයාණෙනි මට අනුකම්පා කළ මැනව'' යනුවෙන් යැයි ජේසුස් වහන්සේට හඬ නැගුවේ

(1) කුරුසියේ සොරුන්ගෙන් අයෙක්

(2) පාවුල් දර්ශනය දුටු මොහොත

(3) ජෙරිකෝවේ අන්ධ මිනිසා

(4) අංශභාග රෝගියා රැගෙන ආ විට

(29) ''දෙවියන් වහන්සේගේ රාජ්‍යයේහි දී ආහාර වළඳන තැනැත්තේ භාග්‍යවන්තයෙකැයි'' පැවසූ අවස්ථාවේ ජේසුස් වහන්සේ ප්‍රකාශ කළ උපමාව වන්නේ,

(1) මහ මංගල භෝජනය (3) යහපත් සමාරිතයාගේ කතාව

(2) වපුරන්නා පිළිබඳ උපමාව (4) පොහොසත් මෝඩයා පිළිබඳ උපමාව

(30) මෙලොව සියලු දෙනාට ම විවෘත, ධර්මිෂ්ඨ හා ගැලවීමෙන් සැරසී සිටින අයට හිමිවන ස්ථානය වන්නේ,

(1) උසස් තානාන්තර (3) දේව රාජ්‍යය

(2) පෘෂ්ඨීමත් බව (4) ධනවත්කම

(31) නැති වූ බැටලුවා, නැති වූ කාසිය උපමා මගින් ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ දේව රාජ්‍ය ප්‍රතිපත්තිය නම්,

(1) නොමග ගිය, අදමිටු මිනිසුන් දෙවියන් වහන්සේ වෙත ගෙන ඒම

(2) නැති වූ කාසිය සොයා ප්‍රීති වීම

(3) ධර්මිෂ්ඨයින් තවදුරටත් රැකබලා ගැනීම

(4) නැති වූ බැටලුවන් සොයා ගාලට ගෙන ඒම

(32) අපගේ පාපය හා අකීකරුකම හේතු කොට ගෙන කෙතරම් උන්වහන්සේගෙන් ඉවත්ව ගියද, උන්වහන්සේ අප එනතුරු බලා සිටින බව අඟවන උපමාව

(1) පොහොසත් මෝඩයා (3) මහ මංගල භොජනය

(2) නැති වූ කාසිය (4) නැති වූ පුත්‍රයා

(33) වංචනික ගබඩාකාරයා පිළිබඳ උපමාවෙන් මතුකරන සත්‍යතාව වන්නේ,
(1) ස්ථානෝචිත ප්‍රඥාවෙන් ක්‍රියා කළ යුතුයි. (3) ගබඩාව පිරිසිදුව තබාගත යුතුයි.
(2) රැකියාව නිවැරදිව කළ යුතුයි. (4) බොහෝ විට වංචාවෙන් ඉවත් විය යුතුයි.

(34) ''ඔබ යන ඕනෑම තැනකට වුවද මමත් ඔබ අනුව එන්නෙමි'' පැවසූ තැනැත්තාට ජේසුස් වහන්සේ දුන් පිළිතුර වන්නේ,
(1) මම යම් දිනක ජීවිතය ජය ගන්නා බව ය.
(2) මනුෂ්‍ය පුත්‍රයාට හිස තැබීමටවත් තැනක් නැති බවය.
(3) මා යන සෑම තැනටම ඔබත් පැමිණිය යුතු බව ය.
(4) මනුෂ්‍ය පුත්‍රයා තවම වැඩ ආරම්භ නොකල බව ය.

(35) 'නගුලට අත තබා ආපසු බලන කිසිවෙක්'' දේව රාජ්‍යයේ සේවයට නුසුදුසු බව ජේසුස් වහන්සේ ප්‍රකාශ කල සේක. මින් අදහස් කළේ,
(1) නගුලට අත තබන අය සුදුසු බව ය.
(2) කැඳවීම භාර ගැනීමට සුදුසුකම් සපුරා තිබිය යුතු බවය.
(3) නියම අවස්ථාවේ කැදවීම ලබන විට සියල්ල කැපකල යුතුබව ය.
(4) නගුලට අත තබා ආපසු නොහැරෙන ලෙස ය.

(36) දේව රාජ්‍යයේ පුරවැසිභාවය පතන අය නිහතමානී වීම වැදගත් බව අඟවන උපමාව
(1) වපුරන්නාගේ උපමාව (3) නිධානය පිළිබඳ උපමාව
(2) දැල පිළිබඳ උපමාව (4) පරිසියා හා අයකැමියා පිළිබඳ උපමාව

(37) ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලට අනුව
(1) ධනවතුන් තම සියලු ධනය බෙදා හැරිය යුතු වේ.
(2) ධනවතුන් දයානුකම්පාවෙන් දිළිඳුන් රැකබලා ගත යුතු වේ.
(3) දිළිඳුන් ධනවතුන්ගෙන් ලැබෙන දේ බලා සිටිය යුතු වේ.
(4) දිළිඳුන් ධනවතුන්ගෙන් ඈත්ව සිටිය යුතු වේ.

(38) ජේසුස් වහන්සේ ප්‍රකාශ කල ලෙස අපගේ ජීවිත ඵල නොදරන්නේ නම්, අප කල යුත්තේ,
(1) ලෞකික සැප සම්පත් සොයා යා යුතු වේ.
(2) ගෘහ යාච්ඤා රැස්වීම් පැවැත්වීමට කටයුතු කළ යුතු වේ.
(3) දේව වචනය පිළිබඳ තොරතුරු රැස් කළ යුතු වේ.
(4) මනස්ථාපනය වී සුභ අස්න අදහා ගත යුතුවේ.

(39) ජේසුස් වහන්සේ විශිෂ්ට ගුරුවරයකු ලෙස ගැඹුරු ගුණධර්ම පොදු ජනතාවට පිළිගැන්වූයේ,
(1) ඇරමෙයික් භාෂාවෙනි. (3) ලතින් භාෂාවෙනි.
(2) ග්‍රීක් භාෂාවෙනි. (4) ප්‍රංශ භාෂාවෙනි.

(40) දේව සබඳතාව ගොඩ නඟා ගැනීමට කිතුනු අප සතු ප්‍රබල අවියක් වන්නේ,
(1) ගෘහ රැස්වීම් පැවැත්වීම
(2) බයිබල් අධ්‍යයන වැඩසටහන් සංවිධානය
(3) යාච්ඤාවට දිනපතා යොමුවීම
(4) දහම් ගුරුවරියක වීමට කටයුතු කිරීම

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

(i) පළමුවන ප්‍රශ්නයට හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(ii) පළමුවන ප්‍රශ්නයට ලකුණු 20ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10යි.

(01) (1) ජේසුස් වහන්සේ වෙනුවෙන් දෙමාපියන් ඉටුකළ ජුදෙව් චාරිත්‍ර 2ක් නම් කරන්න.

(2) ශ්‍රාවකයින් 12 හා 70 දෙනාගේ චාරිකා අධ්‍යයනය කිරීමේ දී මතුවන වැදගත් කරුණු 2ක් ඉදිරිපත් කරන්න.

(3) ගතානුගතික අදහස් දැරූ සද්දුසිවරු හඳුනාගැනීමට ඇති විශේෂ ලක්ෂණ 2ක් ලියන්න.

(4) රෝම ආණ්ඩුකාරයා ඉදිරියේ ජේසුස් වහන්සේට විරුද්ධව එල්ල වූ චෝදනා 2ක් ලියන්න.

(5) ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තියට සම්බන්ධ වූවන් දෙදෙනෙක් නම් කරන්න.

(6) ජේසුස් වහන්සේ යහපත් සමාරිතයාගේ උපමාව ප්‍රකාශ කළේ කාහට ද? කුමන ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් ද?

(7) දේව රාජ්‍ය වර්ධනය පිළිබඳ ඉගැන්වීමට ජේසුස් වහන්සේ යොදාගත් උපමා 2ක් නම් කරන්න.

(8) දේව රාජ්‍ය කැඳවීමට ප්‍රතිචාර දැක්වීමේ දී එහි භාරදූරකම වටහා දීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ නිදසුන් 2ක් ලියන්න.

(9) දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත කුමක් ද?

(10) කිතුනු දරුවෙකු ලෙස ජීවිත අභියෝග ජය ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග 2ක් ලියන්න.

(ලකුණු 2 × 10 = 20)

(02) නාසරෙත්හි ප්‍රකාශය

(1) ජේසුස් වහන්සේ කළ නාසරෙත්හි ප්‍රකාශයට අනුව උන්වහන්සේගේ කරුණාව හා අවධානය යොමු වූ ජන කණ්ඩායම් 2ක් නම් කරන්න.

(2) එම කණ්ඩායම් උන්වහන්සේ පිළිගෙන කටයුතු කළ ආකාරය ලියන්න.

(3) එලෙස වර්තමාන සමාජයේ පීඩාවට පත් වූවන් නම් කොට ඔවුන් වෙනුවෙන් ඔබට ඉටුකල හැකි මෙහෙය ලියන්න.

(03) ව්‍යවස්ථාවේ හරය ප්‍රේමයයි.

(1) ජේසුස් වහන්සේට පව් කමා කිරීමේ බලය ඇතිබව ප්‍රකාශ කළේ කුමන අවස්ථාවේ දී ද?

(2) පරිසිවරු ජේසුස් වහන්සේට එල්ල කළ චෝදනා 2ක් ලියන්න.

(3) ජේසුස් වහන්සේ හා පරිසිවරු අතර පැවති සංවාද තුළින් කිතුනු අපගේ ජීවිතවලට එකතු කර ගත හැකි ආදර්ශ මොනවා ද?

(04) දේව රාජ්‍ය ලකුණු හෙවත් ප්‍රාතිහාර්ය කාණ්ඩ 4ක් යටතේ වර්ග කල හැකි ය.

(1) එම කාණ්ඩ 4 නම් කරන්න.

(2) එම කාණ්ඩවලට අදාලව ජේසුස් වහන්සේ සිදුකල ප්‍රාතිහාර්ය බැගින් ලියන්න.

(3) ජේසුස් වහන්සේ කෙරෙහි අදහන ඔබ, උන්වහන්සේගේ බලවත්කම අත්දුටු අවස්ථාවක් පිළිබඳව ලියන්න.

(05) දේව රාජ්‍ය පුරවැසියන් සඳහා ආදර්ශ නායකත්වය

(1) ජේසුස් වහන්සේ සේවක නායකත්වය ආදර්ශයෙන් දැක් වූ අවස්ථා 2ක් ලියන්න.

(2) දේව රාජ්‍ය පුරවැසියන්ගෙන් අපේක්ෂිත චරිත ලක්ෂණ 3ක් ලියන්න.

(3) එම චරිත ලක්ෂණ ඔබේ ජීවිතයට අදාල කර ගනිමින් සමාජය තුළ ක්‍රියාකල හැකි ආකාරය විස්තර කරන්න.

(06) භාග්‍ය හා අභාග්‍ය

(1) ''අගපේ'' නමැති ග්‍රීක වචනයේ අර්ථය ලියන්න.

(2) ලූක් සුබසුනට අනුව භාග්‍යවන්තයන් ලෙස සැලකෙන කණ්ඩායම් 2ක් නම් කර ඔවුන් පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.

(3) ජේසුස් වහන්සේ වදාල 'රන් අරන' අනුව කිතුනු ඔබේ ජීවිතය හැඩගස්වා ගතයුතු ආකාරය පහදන්න.

(07) පහත මාතෘකා අතරින් 2ක් පිලිබඳ කෙටි සටහන් ලියන්න.

(1) දේව රාජ්‍ය වර්ධනය

(2) ශු. බයිබලය තුළින් ලැබෙන මඟපෙන්වීම

(3) යාච්ඤාවෙන් ජීවිත සවිමත් කර ගනිමු.

(4) කිතුනු දරුවෙකු ලෙස සේවක නායකත්වය දරමු. (ලකුණු $2 \times 5 = 10$)